## 1.15 ශ්‍රී ලංකාවේ කිරිඅම්මා ඇදහීම

ඩබ්ලිව්.පී. උදයසිරි විදානපතිරණ
"ලක්මාල්", ගුරුගෙදර මාවත, පිටිගල.

### ABSTRACT

වැද්දන්ගේ මළවුන් (නෑ යකුන්) පිදීමෙන් ප්‍රභවය ලැබූ කිරිඅම්මා (ඇදහීම) සංකල්පය මූලික අවශ්‍යතා පහකින් (05) උපලක්ෂිත වන්නේය. ගර්භිණීකරණය, ගර්භ සංරක්ෂණය, උපන් බිලිඳුන්ගේ ලෙඩ රෝග ආදියෙන් ආරක්ෂාව, දඩයම් සඵල කර ගැනීම සහ බඹර පැණි ලබා ගැනීම ඊට අයත් වේ.

ලෝකයේ අන්‍ය ජාතීන් අතර දක්නට නොලැබෙන කිරිඅම්මා පිදීම ලංකාවේ වැදි සහ සිංහල බෞද්ධ ජනතාව අතර පමණක් පවතින ඇදහීම් ක්‍රමයකි. තත් ඇදහීම පූර්වෝක්ත ජන කණ්ඩායම් අතර සම්ප්‍රදායයන් තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. පත්තිනි සංකල්පය මිශ්‍ර වූ සම්ප්‍රදාය
2. රිද්දිබිසෝවරු සම්බන්ධ සම්ප්‍රදාය
3. වැද්දන්ගේ මළවුන් පිදීමෙන් ප්‍රභවය ලැබූ සම්ප්‍රදාය වශයෙනි.

මෙයින් ලංකාවේ කිරිඅම්මා පිදීමේ (සංකල්පයේ) ප්‍රභවයට පාදක වූයේ තෙවන සම්ප්‍රදායයි. මේ අනුව කිරිඅම්මා පිදීම යනු පත්තිනි පමණක් මූලික කොට සිදුකෙරෙන්නක් යන මතය අපගේ මෙම පර්යේෂණයෙන් බැහැර කොට තිබේ.

පූර්වෝක්ත සම්ප්‍රදායත්‍රය යටතේ ලංකාවේ වැදි සහ සිංහල බෞද්ධ ජනතාව සශ්‍රීකත්වය හා ආරක්ෂාව වැනි සමාජයීය අවශ්‍යතා වෙනුවෙන් විශේෂයෙන් කිරිඅම්මාගේ පිහිට අපේක්ෂා කළ අතර ඇය වෙනුවෙන් ශාන්තිකර්ම රැසක් ද පවත්වා තිබේ. ගලේ යකුම, අඟුරුමස් යහන, ඊතලේ යකුම, හැත්මේ නැටුම, කිරිඅම්මා සංකල්පය හා තදනුබද්ද වැදි ශාන්තිකර්ම කීපයක් වන අතර තොරන් පහන් එළිය, මල් එළිය, රිද්දි යාගය, කිරිඅම්මා දානය, සිංහල ජනතාව අතර පවතින කිරිඅම්මා සංකල්පය හා තදනුබද්ද ශාන්තිකර්ම අතුරින් කීපයකි.

උක්ත ශාන්තිකර්ම ඇසුරේ පවතින කන්නලව්, කවි, යනාදියෙහි අපට ආවේණික සියුම් නාද ලෙලවීමේ (නාද හැසිරවීමේ) ශෛලියක් මෙන්ම ලෝක සම්මතයේ පවතින ස්වර දොළසේ කම්පන සංඛාවෙන් බැහැර වූ දේශජ අනන්‍යතාවක් සහිත නාද භාවිතයක් පවතින බව මෙම පර්යේෂණයෙන් හඳුනාගෙන තිබේ.